# OPERATIONS MANAGEMENT (Part-VII)


***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

**ආයතනයක මුළු තොග පිරිවැය කොටස් 2 කි.**

1. තොග ඇණවුම් කිරීමේ පිරිවැය
2. තොග පවත්වා ගෙන යාමේ පිරිවැය

**<u>තොග ඇණවුම් කිරීමේ පිරිවැය</u>**

**<u>නිදසුන්</u>**

- තොග ගැණුම් මිල
- ඇණවුම් පිළියෙළ කිරීමේ වියදම්
- ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ වියදම්
- ද්‍රව්‍ය ගෙන ඒමේ වියදම්

ClassWork.LK

## තොග පවත්වාගෙන යාමේ වියදම්

ගබඩාවට තොග ලැබූ අවස්ථාවේ සිට ගබඩාවෙන් තොග නිකුත් කිරීම තෙක් (නිෂ්පාදන අංශයට හෝ අලෙවි අංශයට හෝ මාරු කිරීම තෙක්) සියලු වියදම් තොග පවත්වාගෙන යාමේ වියදම් වේ.

### නිදසුන්

- ගබඩා වියදම්
- ගබඩා විදුලි ගාස්තු
- ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ වියදම්
- ගබඩා මුරකරුගේ වේතන
- ගබඩා රක්ෂණ ගාස්තු
- තොග වාර්තා තබා ගැනීමේ වියදම්
- තොග හානි වියදම්

ClassWork.LK


# ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ)

ආයතනයක තොග සම්බන්ධ මුළු පිරිවැය අවම වන පරිදි වරකට ඇණවුම් කළ යුතු තොග ඒකක ප්‍රමාණය ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) වේ.

ආර්ථික ඇණවුම් ප්‍රමාණයේ දී ඇණවුම් කිරීමේ පිරිවැයත් තොග පවත්වා ගෙන යාමේ පිරිවැයත් එකිනෙකට සමාන විය යුතු ය.

ClassWork.LK

# ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කිරීම ප්‍රස්තාරය මගින්




EOQ ආර්ථික ඇණවුම් ප්‍රමාණය

Class Work.LK

# ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කිරීම සමීකරණයක් මගින්

පහත සඳහන් සමීකරණයෙන් ද ආර්ථික ඇණවුම් ප්‍රමාණය ග ණනය කළ හැකිය.

$$EOQ = \sqrt{\frac{2DCo}{PCs}}$$

EOQ = ආර්ථික ඇණවුම් ප්‍රමාණය

ClassWork.LK

Co = එක් ඇණවුමක් සඳහා පිරිවැය

D = වාර්ෂික තොග අවශ්‍යතාව (පරිභෝජණය) / වාර්ෂික ඉල්ලුම

PCs = එක් ඒකකයක් කාලච්ජේදයක් (වර්ෂයක්) තුළ පවත්වාගෙන යාමේ පිරිවැය

**නිදසුන :**

සහල් තොග අලෙවි මධ්‍යස්ථානයක තොග පවත්වාගෙන යාමට අදාළ වියදම් සම්බන්ධ තොරතුරු පහත සඳහන් වේ.

(වටිනාකම රුපියල් දහස්වලිනි)

- එක් ඇණවුමක් සඳහා පිරිවැය 50/-කි.
- කාලච්ඡේදයේ තොග අවශ්‍යතාව ඒකක 10000කි.
- එක් ඒකකයක් කාලච්ඡේදය පුරා පවත්වාගෙන යාමේ පිරිවැය රු. 100කි.

- ඉහත තොරතුරු ඇසුරින් ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කරන්න.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura